# ගොවිපලට සිදුවූ අකරතැබ්බය



මිතුජ රන්දිදු රත්නායක

# ගොවිපලට සිදුවූ අකරතැබ්බය

# මිතුජ රන්දිදු රත්නායක

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අසුදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටෙහි පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මට මේ කතන්දර පොත ලියන්නට

අවස්ථාව ලබා දී  මාව ගත්කතුවරයෙක්

බවට පත් කරන්නට

මා උනන්දු කරවූ  ගුරු මැණිවරුන්ට,

ගුරු පියවරුන්ට, මාගේ දෙමව්පියන්ට

හා පවුලේ සැමට මෙම පොත

ආදරයෙන් පිළිගන්වමි .

## ගොවිපලට සිදුවූ අකරතැබ්බය

එකමත් එක ගමක පුංචි ගොවිපලක් තිබුණා. ඒ ගොවිපලේ හරක්, උරන්, එළුවන්, කුකුළන් හාවන් බැටළුවන් වගේම අශ්වයොත් ජීවත් වුණා.





ගොවිලේ නායකයා වුනේ වයසක අශ්වයෙක්. මේ අශ්වයා ගොවිපලේ සියලුම සතුන් හොඳින් රැක බලා ගත්තා . දවසක් අශ්ව නායකයා  අසනීප වුණා. ටික දිනකින් අශ්වයා මිය ගියා. ගොවිපලේ හැමෝටම හරිම දුකයි.

දවස් කීහිපයක් ගත වුණා . දැන් කවුද අපේ අපේ නායකයා වෙන්නේ  හැමෝම කතා වුණා .

“මමයි නායකයා.....” “මමයි නායකයා .....” කියල හැමෝම රන්ඩු කළා.  ගොවිපලේ සතුන් අතර තිබු සමගිය ටිකෙන් ටික නැති වුණා.



දවසක් උදෑසන බලන විට එක එළුවෙක් නැති වෙලා. හැමතැනම බැලුවා කොහෙවත් හිටියේ නැහැ . තව දවසක් කුකුළෙක් නැති වුණා. තව හාවෙකුත් නැති වුණා. ගොවිපලේ සතුන් කීපදෙනෙක් අතුරුදහන් වුණා.



ගොවිපලේ සිටි තරුණ එළුවෙක් මෙසේ පැවසුවා.



“අද රෑ හැමෝම ගොවිපලට  එන්න. කවුද කියල අපි විපරම් කරලා බලමු”

ඒ යෝජනාවට කවුරුත්  කැමති වුණා.



රාත්‍රිය උදා වුණා. ගොවිපලට කපටි හිවලෙක් එනවා දැක්කා. හිවලා ගොවිපලට ඇතුල් වෙනකොටම නිදාගෙන වගේ හිටපු අශ්වයා වේගයෙන් පා පහරක් එල්ල කළා. හිවලා නොන්ඩි ගසමින්

ගොවිපළෙන් දිව ගියා.

පසුදා උදෑසනම අවදි වූ සතුන් පෙර දින රාත්‍රියේ සිදුවූ සිදුවීම ගැන හැමෝම කතා වුණා. ඒ අතරින් පැමිණි පුංචි ඌරු පැටියෙක් මෙසේ යෝජනා කළා.

“අපි අපේ නායකයා ලෙස එළු මාමාව තෝරා ගමු”.

ඒ යෝජනාවට කවුරුත් කැමති වුණා ගොවිපලේ සතුන් සියලු දෙනාම සතුටින් හා සමගියෙන් ජීවත් වුණා.



# පසුවදන

රටෙහි  අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව  වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,  පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**
**සෙනෙවිරත්න මහලේකම්**



**මිතුජ රන්දිඳු රත්නායක**
**ශාන්ත අන්තෝනි විද්‍යාලය - මහනුවර**